# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL


සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

World Health Organization Sri Lanka

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

## 20.උද්‍යාන (ළමා / පොදු)

COVID තත්වයට ප්‍රතිචාර වශයෙන් වර්තමාන තත්වය යටතේ පුද්ගල දුරස්ථාවය පවත්වා ගැනීමට හැකිවන පරිදි පුද්ගලයින් සංඛ්‍යාව අවම කළ යුතුය.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

**කළමනාකරණ කාර්ය මණ්ඩලය**

- උද්‍යානයේ ප්‍රමාණය අනුව පුද්ගලයින් ගණන සීමා කළ යුතුය.
- මුහුණු ආවරණ පැළඳීම සුදුසු යැයි දැන්වීම් උද්‍යානයේ ප්‍රදර්ශනය කළ යුතු අතර, ශ්වසන ආචාර විධි පිළිපැදීම සහ නාඳුනන අය සමඟ මීටර 1 ක පුද්ගල දුරස්ථාවය පවත්වාගැනීම සුදුසු වේ.
- සෞඛ්‍ය බලධාරීන් මේ සඳහා අවසර දෙන තුරු ළමා උද්‍යාන ක්‍රීඩා කරන ස්ථාන ක්‍රියාත්මක නොවිය යුතුය.
- පුද්ගලයින් සංඛ්‍යාව සීමා කළ යුතු බැවින්, දරුවෙකු සමඟ යාමට ඉඩ දිය යුත්තේ එක් පුද්ගලයෙකුට පමණි.
- ප්‍රවේශ පත්‍ර හා මුදල් පරිහරණය අවම කිරීම සඳහා ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය.
- පරිශ්‍රයට ඇතුළු වීමට පෙර අත් සේදීමේ පහසුකම් ලබා දිය යුතුය.
- උද්‍යානය අසල සහ ඇතුළත ආහාර වෙළෙන්දන්ට / වෙනත් විකුණුම්කරුවන්ට මුහුණු ආවරණයක් පැළඳීමට උපදෙස් දිය යුතු අතර පුද්ගල දුරස්ථභාවය සහ දෑත් පිරිසිදුව තබා ගැනීමට දිරිමත් කළ යුතුය.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකඟතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම භාරකරුගේ වගකීම වේ.

**සේවාදායකයා**

- එකිනෙකාගෙන් මීටර් 1 ක දුරක් පවත්වා ගනිමින් ටිකට් කවුන්ටරයේ පෝලිමේ සිටින්න.
- පෝලිම්වල සිටින විට හෝ ආහාර / පාන අලෙවිකරුවන් සිටින ස්ථානවල මුහුණු ආවරණයක් නිසි ලෙස පැළඳිය යුතුය.
- මීටර 1 ක පුද්ගල දුරස්ථ බව සහතික කරන්න.
- ඔබගේ ආරක්ෂාව සඳහා අවසර ලත් ධාරිතාව ඉක්මවා ඇත්නම් උද්‍යානයට ඇතුළු නොවන්න.
- බාහිර පෘෂ්ඨයන් සහ ඔබේ මුහුණ අනවශ්‍ය ලෙස ස්පර්ශ කිරීම අවම කරන්න.
- අවම වශයෙන් තත්පර 20 ක් වත් සබන් හා වතුරෙන් උද්‍යානයෙන් ආපසු පැමිණ අත් සේදීම සහ නිවසට ඇතුළු වීමට පෙර ස්නානය කර ඔබේ ඇඳුම් සෝදන්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- සියලුම උද්‍යානවලට අදාළ උපදෙස් උද්‍යානයේ දොරටුවේ සහ පරිශ්‍රයේ ප්‍රදර්ශනය කෙරේ.
- පුද්ගලයින් උපදෙස් පිළිපදින්නේද යන්න ආරක්ෂක කාර්ය මණ්ඩලය නිරීක්ෂණය කළ යුතුය.




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

28/06/2020